# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
# නාගරික සංවර්ධන අධිකාරිය (UDA)

# ඇබෑර්තු

පහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සතු අය විය යුතුය.

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය)

**01. සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණ / කළමනාකරණ / වාණිජ්‍ය / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

ප්‍රථම උපාධිය ලබාගත් පසු, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "**කළමනාකරණ තලයේ**" අවම වසර 18 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** HM 1-3-2016 රුපියල් (86,865/- 15 x 2,270 - 120,915/-)

**02. පොදු කොන්දේසි :**

අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව රජයේ / සංස්ථාවල අයදුම්කරුවන්හට අදාළ නොවේ.

ආ) ස්ථිර පදනමින් මෙම පත්කිරීම සිදු කෙරේ.

ඇ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය. (අධිකාරිය විසින් 15% ක දායකත්වයක් දරනු ලබයි)

ඈ) සේවක භාර අරමුදලේ සාමාජිකත්වය. (අධිකාරිය විසින් 3% ක දායකත්වයක් දරනු ලබයි)

**03. ආන්තික ප්‍රතිලාභ :**

අ) රියදුරු සහිත අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක්

ආ) UDA නිවාස ණය හා ආපදා ණය යෝජනා ක්‍රමය

ඇ) වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

ඈ) වෙනත් ආකර්ෂණීය දීමනා ආදිය

04. තෝරාගත් අයදුම්කරු, තමන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව මූලික වැටුප් පරිමාණයට ඉහළින් වැටුප් තලයක් මත තැබීමට සලකා බැලෙනු ඇත.

05. අපේක්ෂකයන් විසින් තමන්ගේ ජීවදත්ත (CV), අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සමග නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් ඇතුළත්ව සකස් කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

06. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, නියමිත කාලය තුළ යොමු කිරීම සහතික කරනු පිණිස එහි සෘජු පිටපතක් කලින් එවීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

**එන්.පී.කේ. රණවීර**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**07 වන මහල, "සෙත්සිරිපාය",**
**බත්තරමුල්ල.**